**සියළුම හිමිකම් ඇවිරිණි.**

**2014 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**

**ව්‍යාපාර සහ ගිණුම්කරණ අධ්‍යයනය**

**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**I පත්‍රය කාලය පැය 03**

**සැලකිය යුතුයි:-**

1) **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
2) **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**
3) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

- පහත සඳහන් ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **01 සිට 04** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ව්‍යාපාරවල පදනම ඇති වන්නේ අවශ්‍යතා සහ වුවමනා වලිනි. මෙම අවශ්‍යතා ඉටු කර ගැනීමට නිෂ්පාදිත යොදා ගන්නා අතර සම්පත්වල ස්වරූපය වෙනස් කිරීමේ ක්‍රියාවලිය තුළින් නිෂ්පාදන බිහිවේ."

01. ව්‍යාපාර බිහිවීමට පදනම වන්නේ

   i. අවශ්‍යතා සහ මිලදී ගැනීමේ හැකියාව ය.
   ii. මිනිස් අවශ්‍යතා සහ වුවමනා ය.
   iii. වුවමනා සහ වුවමනා ඉටුකර ගැනීමේ හැකියාව ය.
   iv. වෙළඳ පොළ මුල්කර ගෙන නිෂ්පාදනය බිහිකර ගැනීමය.

02. මිනිස් වුවමනාවක් වන්නේ

   i. ආහාර ය.
   ii. නිවාස ය.
   iii. සපත්තු ය.
   iv. සෞඛ්‍යය ය.

03. ස්වරූපය අනුව නිෂ්පාදනය වර්ග කරනුයේ

   i. ප්‍රාථමික, ද්විතීක හා තෘතීයික ලෙසය.
   ii. කෘෂි, ධීවර, පතල් හා කැණීම් ලෙසය.
   iii. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ලෙසය.
   iv. භාණ්ඩ හා සේවා හා අදහස් ලෙසය.

04. නිෂ්පාදනයට අදාල අයිතම කිහිපයක් පහත දැක්වේ.

A. කෘෂි නිෂ්පාදන
B. හෝටල් ඉදිකිරීම්
C. සිල්ලර වෙළඳාම
D. ධීවර කර්මාන්තය
E. ගෑස් සහ ජලය
F. ආරක්ෂක සේවා

මේවා අතුරෙන් ප්‍රාථමික නිෂ්පාදනයට අයත් අයිතම වන්නේ

i. A හා D ය.
ii. B හා E ය.
iii. A හා E ය.
iv. A හා F ය.

05. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය තුළින් හඳුනාගත හැකි අවස්ථාවක් සහ තර්ජනයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. තීරණ ගැනීමේ දුර්වලතා - අන්තර් ජාතික බලවේග
ii. නිවැරදි නායකත්වය - හිතකර ආර්ථික ප්‍රතිපත්ති
iii. ව්‍යාපාරවලට හිතකර නීතිරීති - අන්තර් ජාතික බලවේග
iv. සාමය - තීරණ ගැනීමේ දුර්වලතා

06. “සුව සරණ” ළමා නිවාසය ලියාපදිංචි වීමට අදහස් කරයි. මෙම ආයතනය ලියා පදිංචි කළ යුතු පනත කුමක්ද?

i. 1972 අංක 05 දරන සමුපකාර පනත
ii. 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත
iii. 2007 අංක 07 දරන සමාගම් පනත
iv. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

07. අලෙවි සැලැස්මක අන්තර්ගත විය යුතු අයිතමය තෝරන්න.

i. ඇස්තමේන්තුගත අමුද්‍රව්‍ය
ii. අපේක්ෂිත ලාභය
iii. ඇස්තමේන්තුගත ස්ථාවර වත්කම්
iv. අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණය

08. “නිමල්කා” ආයතනයේ අපේක්ෂිත ලාභය රු. 70,000 කි. අපේක්ෂිත විකුණුම් ආදායම රු. 110,000 කි. අපේක්ෂිත විකුණුම් වියදම වන්නේ

i. රු. 30,000 කි.
ii. රු. 40,000 කි.
iii. රු. 70,000 කි.
iv. රු. 180,000 කි.

09. අල්මාරි නිෂ්පාදන ව්‍යාපාරයක අල්මාරියක් වර්ණ ගැන්වීමේදී සුමට කිරීම සඳහා යොදා ගත් වැලි කඩදාසිවලට වන පිරිවැය අයත් වන්නේ

i. වක්‍ර ශ්‍රම පිරිවැයට ය.
ii. සෘජු ශ්‍රම පිරිවැයට ය.
iii. සෘජු ද්‍රව්‍ය පිරිවැයට ය.
iv. වක්‍ර ද්‍රව්‍ය පිරිවැයට ය.

10. ව්‍යාපාරයක මෙහෙයුම් කටයුත්තකට අදාළවන අයිතම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ස්ථානගත කිරීම, සේවක මණ්ඩලය, වෙළඳපල ප්‍රමාණය
ii. ස්ථානගත කිරීම, අවශ්‍ය ඉඩම් සහ ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ
iii. යන්ත්‍ර උපකරණ, සේවක මණ්ඩලය, බලශක්තිය
iv. බලශක්තිය, ඉඩම් සහ ගොඩනැගිලි, සේවක මණ්ඩලය

11. “මල්ෂාණි” මල් බඳුන් නිෂ්පාදන ආයතනයේ මල් බඳුනක නිෂ්පාදන පිරිවැය රු. 400 කි. ඇය 10% ක ලාභාන්තිකයක් තබාගෙන විකුණන්නේ නම් මල් බඳුනක **විකුණුම් මිල**වන්නේ

i. රු. 390 කි.
ii. රු. 400 කි.
iii. රු. 410 කි.
iv. රු. 440 කි.

12. වාණිජ බැංකුවල ස්ථාවර තැන්පතුවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ

i. සාමාන්‍ය ඉතිරිකිරීම්වලට වඩා වැඩි පොළී අනුපාතයක් හිමි වීම ය.
ii. අවදානම වැඩි, සුරක්ෂිත ලාභදායී ආයෝජන මාර්ගයක් වීම ය.
iii. ව්‍යාපාර වැඩි වශයෙන් ආරම්භ කරන තැන්පතු වර්ගයක් වීම ය.
iv. ව්‍යාපාරිකයින්ට කැමති විටක මුදල් තැන්පත් කිරීමටත් එම තැන්පතු ආපසු ලබා ගැනීමට හැකියාව ඇති තැන්පතු විශේෂයක් වීම ය.

13. බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවක් වන්නේ

i. සම්පත් බැංකුව ය.
ii. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ය.
iii. ලංකා බැංකුව ය.
iv. මහජන බැංකුව ය.

14. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. බැංකුවක නමක් සඳහන්වූ රේඛනය සාමාන්‍ය රේඛනයකි.
ii. චෙක්පත් මගින් ගනුදෙනු කළ හැක්කේ ඉතිරිකිරීම් ගිණුම් හිමියන්ටය.
iii. චෙක්පතේ අණකරු සැමවිටම ජංගම ගිණුම් හිමියාය.
iv. විනිමය බිල් ආඥා පණත චෙක්පතකට අදාළ නොවේ.

15. පහත දැක්වෙන්නේ මහජනතාවගෙන් තැන්පතු භාර ගන්නා සහ භාර නොගන්නා ආයතන කීපයකි.

A. මූල්‍ය සමාගම්
B. වණික් බැංකු
C. ඉතිරිකිරීම් බැංකු
D. මුදල් තැරැව්කාර සමාගම්
E. වාණිජ බැංකු

මේවා අතුරින් මහජනතාවගෙන් තැන්පතු භාරගන්නා ආයතන ඇතුළත් නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න

i. A, B හා C
ii. A, C හා D
iii. A, D හා E
iv. A, C හා E

16. රක්ෂණය සම්බන්ධයෙන් එකඟතාවයක් ඇති වීමේදී රක්ෂණ ආවරණය ලබා ගන්නා පාර්ශවය හැඳින්වෙන්නේ

i. රක්ෂිතයා නමිනි.
ii. රක්ෂකයා නමිනි.
iii. තෙවන පාර්ශවය නමිනි.
iv. ආරක්ෂකයා නමිනි.

17. පහත දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියක උපාංගයන්ය.

A පණිවුඩය
B යවන්නා
C ලබන්නා
D මාධ්‍යය
E ප්‍රතිචාරය

මෙම ක්‍රියාවලිය අනුපිළිවලින් ගැලපූ නිවැරදි පිළිතුර තෝරන්න.

i. A, B, D, C හා E
ii. B, A, D, C හා E
iii. B, C, A, D හා E
iv. B, D, A, C හා E

18. ප්‍රවාහනය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. මාර්ගය, මාධ්‍යය, පිරිවැය සහ බලය ප්‍රවාහනයේ මූලිකාංගයන්ය.
ii. දුම්රිය, ප්‍රවාහනයට අදාල පර්යන්තය දුම්රිය දෙපාර්තමේන්තුවයි.
iii. බරින් වැඩි භාණ්ඩ ප්‍රවාහනයට වඩාත් යෝග්‍ය වන්නේ ගුවන් ප්‍රවාහනයයි.
iv. මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල ප්‍රවාහනයේ මූලිකාංගයට නිදසුනකි.

19. කොටස් මිලදී ගත් ආයෝජකයෙකු ඒවා ගත් මිලට වඩා වැඩි මිලකට විකිණීමෙන් ලබන වාසිය හැඳින්වෙන්නේ

i. ලාභාංශ ලෙසය.
ii. ප්‍රාග්ධන ලාභ ලෙසය.
iii. ආදායම් ලෙසය.
iv. විකුණුම් මිල ලෙසය.

20. බිම්සර තමා සතු මුදල් විවිධ ආයෝජන මාර්ගයන්හි යෙදවීමට අදහස් කරයි. මෙම ආයෝජනයන් හැඳින්වෙන්නේ

i. ඒකක භාර ලෙසය.
ii. ආයෝජන කළඹක් ලෙසය.
iii. කාලීන තැන්පතු ලෙසය.
iv. ඉතුරුම් තැන්පතු ලෙසය.

21. මුදල් පොතේ බැර පැත්තේ සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ;

i. ජ'නල් වවුචරය ය.
ii. බැර පත ය.
iii. ලදු පත ය.
iv. වවුචරය ය.

22. සපුමල් ව්‍යාපාරයට ලැබුණු චෙක්පත් බැංකුවේ තැන්පත් කළ පසු, එය අගරුවූ බව දැනුම් දීමෙන් පසු ව්‍යාපාරය විසින් තැබිය යුතු නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| i. | බැංකු තීරුව | - හර | බැංකු තීරුව | - බැර |
| ii. | අගරු චෙක්පත් ගිණුම | - හර | බැංකු තීරුව | - බැර |
| iii. | ණය හිමි ගිණුම | - හර | අගරු චෙක්පත් ගිණුම | - බැර |
| iv. | අගරු චෙක්පත් ගිණුම | - හර | ණය ගැති ගිණුම | - බැර |

23. 2014.03.31 දිනට මුදල් පොතේ සංශෝධිත ශේෂය රු. 12,500 කි.

- උපලබ්ධි නොවූ චෙක්පත් රු.2,500
- බැංකු ගාස්තු රු. 250
- ණය ගැති ප්‍රේෂණ රු.1,250

2014.03.31 දිනට මුදල් පොතේ පැවැති ශේෂය

i. රු. 11,500 කි.
ii. රු. 12,750 කි.
iii. රු. 13,750 කි.
iv. රු. 14,000 කි.

24. මුදල් පොතේ හර පැත්තේ සටහන් කෙරෙනුයේ

i. වෙළඳ වට්ටම් ය.
ii. මුදල් වට්ටම් ය.
iii. ලද වට්ටම් ය.
iv. දුන් වට්ටම් ය.

25. අංජනගේ ව්‍යාපාරයේ සුළු මුදල් භාරකරුට 2014 මාර්තු 01 දින රු. 1,500 ක මුදලක් ලබා දෙන ලදී. 2014.03.15 දින වන විට සුළු වියදම්වල එකතුව රු. 1,350 කි. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම සහ 2014.03.15 දිනට ප්‍රතිපූරණය කළ යුතු අගය වනුයේ

i. රු.1,350 හා රු. 150 කි.
ii. රු.1,500 හා රු. 150 කි.
iii. රු.1,500 හා රු. 1,350 කි.
iv. රු.1,350 හා රු. 1,500 කි.

26. පහත දැක්වෙන්නේ ගනුදෙනු දෙකකි.

A අමල් සමාගමට ණයට විකුණුම් රු.12,000 කි.
B එම සමාගමෙන් ආපසු එවන ලද භාණ්ඩ රු. 4,000 කි.

ඉහත ගනුදෙනුවලට අදාල මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්

i. ඉන්වොයිසිය සහ හර පත ය.
ii. ඉන්වොයිසිය සහ වවුචරය ය.
iii. හරපත සහ වවුචරය ය.
iv. ඉන්වොයිසිය සහ බැරපත ය.

27. අඩුවීම "හර" හා වැඩි වීම බැර යන ගිණුම්කරණ මූල ධර්මය අදාල වන්නේ

i. හිමිකම් ගිණුම් හා වත්කම් ගිණුම්වලට ය.
ii. වත්කම් ගිණුම්හා වියදම් ගිණුම්වලට ය.
iii. ආදායම් ගිණුම් හා වගකීම් ගිණුම්වලට ය.
iv. වගකීම් ගිණුම් හා වියදම් ගිණුම්වලට ය.

28. කිසියම් ගනුදෙනුවක් සටහන් කිරීම සඳහා එයට අදාල විශේෂිත මූලික පොතක් නොමැති අවස්ථාවකදී එම ගනුදෙනුව සටහන් කිරීමට යොදාගනු ලබන මූලික සටහන් පොත වනුයේ

i. ආපසු යැවුම් ජ'නලයයි.
ii. මුදල් පොතයි.
iii. විකුනුම් ජ'නලයයි.
iv. පොදු ජ'නලයයි.

- පහත දැක්වෙන්නේ ගිණුම්කරණ වැරදි කිහිපයකි. එම තොරතුරු ඇසුරින් **ප්‍රශ්න අංක 29 සහ 30** සඳහා පිළිතුරු සපයන්න.

A - රු. 1200 ක රක්ෂණ ගාස්තු ගෙවීම් ගිණුම් පොත්වල සටහන් වී නැත.
B - රු. 3000 ක ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම මුදල් පොතේ පමණක් සටහන් වී තිබීම.
C - රු. 3000 ක ලද වට්ටම් රු. 3300 ක් ලෙස ගිණුම්වල සටහන් වී තිබීම.
D - විකුණුම් ජ'නලයේ එකතුව රු. 2000 කින් වැඩි වීම.
E - මෝටර් රථ අළුත්වැඩියා රු.2500 මෝටර් රථ ගිණුමේ සටහන් කර තිබීම.

29. මේවායෙන් ශේෂ පිරික්සුමේ එකතුව අතර වෙනසක් ඇති නොකරන වැරදි වනුයේ

i. A, B හා E ය.
ii. A, C හා E ය.
iii. B, C හා E ය.
iv. B, C හා D ය.

30. ශේෂ පිරික්සුමේ එකතුව අතර වෙනසක් ඇති කරන වැරදි වනුයේ;

i. B හා E ය.
ii. A හා Eය.
iii. B හා D ය.
iv. C හා D ය.

31. සිය මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීමේ දී ව්‍යාපාරයක් විසින් අදාළ කර නොගන්නා අයිතමය වන්නේ

i. විකුණුම් ආදායම් ය.
ii. ස්ථාවර වත්කම් මිලට ගැනීම් ය.
iii. විකුණුම් හා බෙදා හැරීමේ වියදම් ය.
iv. ලද වට්ටම් ය.

32. ව්‍යාපාරයක ගිණුම් පොත්වල තබා තිබූ ද්විත්ව සටහනක් පහත පරිදි විය.

**කඩ කුළී වියදම් ගිණුම හර** රු. 2,000

**උපචිත කඩ කුළී වියදම් ගිණුම** රු. 2,000

ඉහත සටහන තැබීමට හේතු වූ ගනුදෙනුව තෝරන්න

i. වාර්ෂික කඩ කුළී වියදම රු.48,000 වුවත් රු. 50,000ක වාර්ෂික කඩ කුළී වියදම ආයතනය විසින් ගෙවා ඇත.
ii. ගිවිසගත් වාර්ෂික කඩ කුළිය රු. 12,000ක් වුවත් ගෙවා ඇත්තේ රු. 10,000ක් පමණි.
iii. ව්‍යාපාර හිමියාගේ රු. 2,000ක ගෙවල් කුළී වියදමක් ව්‍යාපාරය විසින් ගෙවා ඇත.
iv. ව්‍යාපාරය පුළුල් කිරීම උදෙසා රු. 2,000ක මාසික කුළියකට තවත් කඩ කාමරයක් ලබා ගැනීමට ගිවිස ගෙන ඇත.

33. ඇඟළුම් කම්හලක් රු. 800,000ක් ගෙවා මිලට ගෙන තිබූ යන්ත්‍ර වසර 05ක් පුරා භාවිතා කළ හැකිය. වසර 05 අවසානයේ දී මෙම යන්ත්‍රවල සුන්බුන් අගය රු. 50,000කි. මෙම ආයතනයේ වාර්ෂික යන්ත්‍ර ක්ෂය වීම

i. රු. 150,000කි.
ii. රු. 100,000කි.
iii. රු. 800,000කි.
iv. රු. 850,000කි.

34. ආයතනයක් තම ණයගැතියෙකුගෙන් ලැබිය යුතු රු. 3,000ක ණය මුදල බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කළේය. මේ නිසා

i. ආයතනයේ ණයට විකුණුම් ආදායම රු. 3,000කින් අඩු වේ.
ii. ආයතනයේ ජංගම වත්කම් රු. 3,000කින් අඩු වේ.
iii. ආයතනයේ ජංගම වගකීම් රු. 3,000කින් අඩු වේ.
iv. ආයතනයේ විකුණුම් හා බෙදා හැරීමේ වියදම් රු. 3,000කින් අඩු වේ.

35. ලාභ අරමුණු කරගත් ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශ හා ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශ අතර යම් යම් සමානකම් මෙන්ම අසමානකම් ද පවතී.

| "අ" | "ආ" |
|---|---|
| 1. ප්‍රාග්ධන ගිණුම | A ආදායම් හා වියදම් ගිණුම |
| 2. මුදල් ගිණුම | B සමුච්චිත අරමුදල් ගිණුම |
| 3. ලාභාලාභ ගිණුම | C ලැබීම් හා ගෙවීම් ගිණුම |

ඉහත වගුවේ "අ" කාණ්ඩයේ යෙදුම්වලට ගැලපෙන යෙදුම් "ආ" කාණ්ඩයෙන් තෝරා ඇති නිවැරදි අනුපිළිවෙල ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

i. 1A, 2C, 3B
ii. 1A, 2B, 3C
iii. 1B, 2C, 3A
iv. 1C, 2B, 3A

36. දසුන් ක්‍රීඩා සමාජයේ මුළු සාමාජික සංඛ්‍යාව 200 කි. සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි. 2012 වසරේ දීසාමාජිකයන් 20ක් හැර අන් සියලු සාමාජිකයන් සාමාජික මුදල ගෙවා ඇත. මෙම සමිතියේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සහ අදායම් හා වියදම් ගිණුමේ දැක්විය යුතු සාමාජික මුදල් අනුපිළිවෙලින්

i. රු. 2,000 හා රු. 18,000 ක් වේ.
ii. රු. 18,000 හා රු. 20,000 ක් වේ.
iii. රු. 20,000 හා රු. 20,000ක් වේ.
iv. රු. 2,000 හා රු. 22,000ක් වේ.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 37 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිතුමිණ ව්‍යාපාරයේ 2013.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 150 000 |
| බැංකු ණය 10% | | 100 000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 200 000 | |
| තොගය 2012.04.01 | 2 000 | |
| ගැනුම් | 48 000 | |
| විකුණුම් | | 80 000 |
| ආපසු යැවුම් | | 1 000 |
| ආපසු එවුම් | 1 500 | |
| ණයගැතියෝ | 10 000 | |
| ණය හිමියෝ | | 7 500 |
| විදුලි වියදම් | 4 000 | |
| රක්ෂණ ගාස්තු | 3 000 | |
| වේතන | 5 000 | |
| බැංකු ණය පොළී | 10 000 | |
| බැංකු ශේෂය | 55 000 | |
| | 338 500 | 338 500 |

පහත සඳහන් අමතර තොරතුරු ද සපයා ඇත.

(i) 2013.03.31 දිනට තොගය රු. 4 000
(ii) ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම රු. 1 000

37. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ආයතනයේ විකුණුම් පිරිවැය

i. රු. 45,000 කි.
ii. රු. 49,000 කි.
iii. රු. 50,000 කි.
iv. රු.78,500 කි.

38. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ දළ ලාභය

i. රු. 33,500 කි.
ii. රු. 48,000 කි.
iii. රු. 45,000 කි.
iv. රු. 78,500 කි.

39. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය

i. රු. 11,000 කි.
ii. රු. 12,500 කි.
iii. රු. 78,500 කි.
iv. රු. 80,000 කි.

40. 2013.03.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු ජංගම වත්කම්වල වටිනාකම

i. රු. 15,000 කි.
ii. රු. 60,000 කි.
iii. රු. 69,000 කි.
iv. රු. 70,000 කි.

**සියළුම හිමිකම් ඇවිරිණි.**

**2014 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**

**ව්‍යාපාර සහ ගිණුම්කරණ අධ්‍යයනය**

**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**II පත්‍රය**

**සැලකිය යුතුයි:-**

**1.** උපදෙස් දී ඇති පරිදි **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**2. පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින්** තෝරා ගෙන **<u>ප්‍රශ්න පහකට</u>** පමණක් පිළිතුරු සපයන්න.

**01.** 2013 වසරේ දී වෙළෙඳපොළේ පොල් මිල සීඝ්‍රයෙන්ඉහළ ගියේය. පොල් වගා බිම් කැබලි වීම සහ අයහපත් දේශගුණය හේතුවෙන් පොල් සැපයුම සීමා වීම මිල ඉහළ යාමට බලපෑවේය.

ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අදහසින් පසු වූ රුවන් 2013.04.01 දින **"ජනහිත පොල් තොග වෙළඳසැල"** ඇරඹීය. ඔහු සතුව තිබූ රුපියල් 120,000 ක ස්ථාවර තැන්පතුව මුදල් කරගෙන ප්‍රාග්ධනය සපයාගත් ඔහු තමන් සතු වූ රුපියල් 800,000 ක් වටිනා ලොරි රථයද එදිනම ව්‍යාපාරයට යෙදීය. තවත් මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් බැංකු ණයක් ලබාගැනීමට ගිය මොහොතේ දී ව්‍යාපාරය ලියාපදිංචි කර ගැනීමේ වැදගත්කම සහ ව්‍යාපාර සැලැස්මක අවශ්‍යතාවය මතු විය.

- 2014 අප්‍රේල් මාසයේ දී සිදු වූ ගනුදෙනු පහත පරිදි විය.

| | |
|---|---|
| අප්‍රේල් 01 | මාසික කුලියට කඩ කාමරයක් ලබා ගත්තා රුපියල් 15,000 |
| අප්‍රේල් 02 | උපකරණ මිලට ගත්තා රුපියල් 30,000 |
| අප්‍රේල් 03 | පොල් තොගයක් මිලට ගත්තා රුපියල් 70,000 |
| අප්‍රේල් 04 | ගෙන ඒමේ කුලී ගෙව්වා රුපියල් 4,000 |
| අප්‍රේල් 05 | බැංකු ජංගම ගිණුමක් ඇරඹුවා රුපියල් 30,000 |
| අප්‍රේල් 06 | අත්පිට විකුණුම් රුපියල් 85,000 |
| අප්‍රේල් 15 | සේවක වැටුප් චෙක්පතකින් ගෙව්වා රුපියල් 2,000 |
| අප්‍රේල් 27 | අත්පිට ගැණුම් රුපියල් 50,000 |
| අප්‍රේල් 28 | අයිතිකරු පුද්ගලික ප්‍ර යෝජනයට මුදල් ගත්තා රුපියල් 5,000 |
| අප්‍රේල් 30 | අත්පිට විකුණුම් රුපියල් 80,000 |

සැ.යු. * 2013.04.30 දිනට ඉතිරි පොල් තොගයේ වටිනාකම රුපියල් 1,000 කි .

* 2013 අප්‍රේල් මාසය සඳහා ලොරි රථයේ ක්ෂය වීම රුපියල් 3,000කි.

- ඉහතසිද්ධිය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) මෙම සිද්ධිය ඇසුරෙන් ව්‍යාපාරයකට බලපෑම් එල්ල කරන **බාහිර පරිසර සාධකයකට** නිදසුනක් දෙන්න.

ii) **"ජනහිත තොග වෙළඳපොළ"** කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වන්නේ ද ? මෙම ව්‍යාපාරයේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුද?

iii) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමෙන් ව්‍යාපරයකට අත්වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

iv) විධිමත් ආයෝජන මාර්ගයක් පිළිබඳව මෙම සිද්ධියේ සඳහන් වේ. එය කුමක් ද?

v) තොග වෙළෙන්දෙකුගේ කාර්යයන් **දෙකක්** දක්වන්න

vi) ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද?

vii) මෙම ව්‍යාපාරයේ මුදල් පොතේ ශේෂය 2013.04.30 දිනට දක්වන්න

viii) මෙම ව්‍යාපාරයේ 2013.04.30 දිනෙන් අවසන් මාසයේ දළ ලාභය කොපමණ ද?

ix) මෙම ව්‍යාපාරයේ2013.04.30 දිනෙන් අවසන් මාසයේ ශුද්ධ ලාභය කොපමණ ද?

x) මෙම ව්‍යාපාරයේ 2013.04.30 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම කොපමණද?

ල. 2 x 10 = (ල.20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

- (ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

**02.** (i) ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර පරිසරය වශයෙන් දෙයාකාරයකින් වර්ග කෙරේ. ඒ ඇසුරෙන් පහත සඳහන් පද කෙටියෙන් හඳුන්වන්න.

(අ) අභ්‍යන්තර පරිසරය (ල.01) (ආ) බාහිර පරිසරය

(ii) ව්‍යාපාර සංවිධාන විවිධාකාරයෙන් වර්ග කළ ද, මේවාට සුවිශේෂි වු පොදු ලක්ෂණ කිහිපයකි.ඉන් **හතරක්** නම් කරන්න.

(iii) දිල්රංගි සපත්තු නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි.

*2014 ජුලි මාසය තුළදී නිපදවීමට අපේක්ෂිත සපත්තු ජෝඩු සංඛ්‍යාව 200කි.

**ඇස්තමේන්තුගත මාසික පිරිවැය**

| | රු. |
|---|---|
| සම් සඳහා | 50 000 |
| ගම් සඳහා | 10 000 |
| සපත්තු මෝස්තර නිර්මාණය කරන්නාගේ ගාස්තු | 4 000 |
| මල්,බොත්තම්,ගාංචු හා නූල් සඳහා | 3 000 |
| සපත්තු අඩි සඳහා | 5 000 |
| කඩ කුලී | 3 000 |
| විදුලිය හා දුරකථන ගාස්තු | 2 000 |
| සපත්තු සාදන්නාගේ වැටුප එක් සපත්තු ජෝඩුවක් සඳහා | 50 |
| සුපරීක්ෂක ගාස්තු | 4 000 |

(අ) දිල්රංගිගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තු ගත මාසික මුළු පිරිවැය ගණනය කරන්න.

(ආ) එක් සපත්තු ජෝඩුවක අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ඉ) සපත්තු ජෝඩුවක විකුණුම් මිල තීරණය කිරීමේ දී දිල්රංගි විසින් සලකා බැලිය යුතු ප්‍රධාන සාධක **දෙකක්** නම් කරන්න.

මුළු ලකුණු(02x5 = 10)

**03.** (i) (අ) චෙක්පත් රේඛනය කිරීමේ මූලික අරමුණ කුමක්ද? (ල.01)

(ආ) ජංගම ගිණුම් මඟින් ගනුදෙනු කිරීමෙන් ව්‍යාපාරිකයන්ට අත්වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ල.01)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ **සත්‍ය ද?, අසත්‍ය ද?** යන්න සඳහන් කරන්න.

(අ) ණයපත් ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු විසින් නිකුත් නොකරයි.

(ආ) ව්‍යාපාරිකයන්ට චෙක්පත් මඟින් ගනුදෙනු කිරීම සඳහා ජංගම ගිණුමක් අවශ්‍යය.

(ඉ) අනේවාසික මුදල් ගිණුම ඇපයට තබා ණය ලබා ගත නොහැක.

(ඊ) හානිපූර්ණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ නොවේ. (ල.02)

(iii) අනෙකුත් රක්ෂණ ක්‍රම හා සැසඳීමේදී ජීවිත රක්ෂණයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ කිහිපයකි. ඉන් හතරක් නම් කරන්න. (ල.02)

(iv) පහත දැක්වෙන්නේ සන්නිවේදනය සඳහා භාවිතා කරනු ලබන සන්නිවේදන ක්‍රම කිහිපයකි.

- දැන්වීම් පුවරුව
- රැස්වීම
- දැන්වීම් පත්‍රිකා
- වැඩ මුළු
- අන්තර් ජාලය
- මාර්ග සංඥා
- ශබ්ද විකාශන යන්ත්‍ර
- ඇසුරුම් සංකේත

මෙම සන්නිවේදන ක්‍රමයන්ට අදාළ සන්නිවේදන මාධ්‍යය නම් කරන්න. (ල.02)

(v) (අ) පහත සඳහන් දෑ ප්‍රවාහනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රවාහන මාධ්‍යය නම් කරන්න.

A. දියර කිරි ප්‍රවාහනය
B. ස්වභාවික මල් අපනයනය (ල.01)

(ආ) ක්‍රමවත් ගබඩාකරණ පද්ධතියක් නොමැති වුවහොත් ව්‍යාපාර කටයුතු අඩපන වේ. මෙමගින් ව්‍යාපාරයකට සිදුවිය හැකි අහිතකර **ප්‍රතිවිපාක දෙකක්** සඳහන් කරන්න (ල.01)

**(මුළු ලකුණු 02X5=10)**

**04.** (i) සුනිමල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි.

(අ) සුනිමල්ට ඇතිවන මූල්‍ය අවශ්‍යතා කාලය පදනම් කරගෙන කොටස් දෙකකට බෙදිය හැකිය.ඒවා නම් කරන්න. (ල. 02)

(ආ) ඔබ නම් කළ එක් එක් මූල්‍ය අවශ්‍යතා සඳහා නිදසුන් **දෙක** බැගින් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් වන්නේ ආයෝජන මාර්ග කිහිපයකි.

(අ) සීට්ටු දැමීම (ආ) තැන්පතු සහතික

(ඉ) සාමාන්‍ය කොටස් මිලදීගැනීම (ඊ) මුදල් ණයට දීම

විධිමත් හා අවිධිමත් ලෙස එම ආයෝජන මාර්ග වෙන් වෙන් වශයෙන් නම් කරන්න. (ල.02)

(iii) ඒකක භාරයක මුදල් ආයෝජනය කිරීමෙන් ආයෝජකයාට ලැබෙන **ප්‍රතිලාභ දෙකක්** සඳහන් කරන්න. (ල.02)

(iv) "ප්‍රාග්ධන ලාභ" සීමිත සමාගමක කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයකි. "ප්‍රාග්ධන ලාභ" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ? (ල.02)

(මුළු ලකුණු 02x5=10)

## II කොටස - ගිණුම්කරණය

- (ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. )

**05.** (i) 2014.10.01 දින ආරම්භ කළ දිමුතුගේ ව්‍යාපාරයේ මුල් සතියේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2014.10.01 ව්‍යාපාරය සඳහා දිමුතු රු.50,000ක් යෙදුවා.

2014.10.02 ව්‍යාපාරය සඳහා රු. 20,000ක බැංකු ණයයක් ලබා ගත්තා

2014.10.03 සුපන්ගෙන් විකිණීම සඳහා රු.10,000ක භාණ්ඩ ගත්තා

2014.10.04 රු.50,000 ක භාණ්ඩ අත්පිට මුදලට විකුණුවා

2014.10.05 රු.750.00 ක විදුලි බිල්පතක් ගෙව්වා

2014.10.06 දිමුතු විසින් ව්‍යාපාරයේ භාණ්ඩවලින් රු.250.00 ක් වටිනා භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙන ගියා.

2014.10.07 රු.5000ක් වටිනා භාණ්ඩ තොගයක් සුනිල්ට විකුණුවා.

2014.10.07 සුපුන්ට මුදල් ගෙව්වා රු. 8000 යි.

- ඉහත ගනුදෙනු ලෙජරයේ **හරවිය** යුතු ගිණුම හා **බැරවිය** යුතු ගිණුම වෙන වෙනම දක්වන්න.

(ල.04)

(ii) සිතුමිණි ව්‍යාපාරයේ 2014 මාර්තු මාසය සඳහා මුදල් පොතේ බැංකු තීරුව පහත දැක්වේ.

**මුදල් පොත**

| දිනය | විස්තරය | බැංකු (රු.) | දිනය | විස්තරය | බැංකු (රු.) |
|---|---|---|---|---|---|
| 2014.08.01 | **ශේෂ ඉ/ගෙ** | 40,000 | 2014.08.06 | **චෙක්පත් නිකුත් කිරීම්** | |
| 2014.08.05 | මුදල් තැන්පතු | 10,000 | | 125401 (උදාර) | 7,500 |
| | | | | 125402 (සමීර) | 6 200 |
| 2014.08.08 | චෙක්පත් තැන්පතු CM134202 | 6,000 | | | |
| | | | 2014.08.15 | **චෙක්පත් නිකුත් කිරීම්** | |
| 2014.08.28 | චෙක්පත් CM138302 | 7 000 | | 12403 (නිමල්) | 3,200 |
| | | | | 12404 (සුනිල්) | 3,500 |
| | | | 2014.08.31 | ශේෂය ප/ගෙ | 42,600 |
| | | 63,000 | | | 63,000 |

සිතුමිණි ව්‍යාපාරයට 2014 මාර්තු මාසය සඳහා බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශය පහත පරිදි විය.

| දිනය | විස්තරය | ගෙවීම් (රු.) | ලැබීම් (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2014.08.01 | ශේෂය ඉ/ගෙ | - | - | 40 000 |
| 2014.08.05 | මුදල් තැන්පතු | | 10 000 | 50 000 |
| 2014.08.09 | චෙක්පත් ගෙවීම් - 125401 | 7 500 | - | 42 500 |
| 2014.08.15 | ස්ථාවර නියෝග (කල්බදු) | 20 000 | - | 22 500 |
| 2014.08.16 | චෙක්පත් තැන්පතු (CM134202) | - | 6 000 | 28 500 |
| 2014.08.26 | චෙක්පත් ගෙවීම් - 12404 | 3 500 | - | 25 000 |
| 2014.08.27 | ප්‍රේෂණ (ගෙවල් කුලී) | - | 6 500 | 31 500 |
| 2014.08.28 | ප්‍රේෂණ (පොළී) | - | 4 000 | 35 500 |
| 2014.08.30 | බැංකු ගාස්තු | 500 | - | 35 000 |

අවශ්‍ය වන්නේ,

(i) 2014.08.31 දිනට සංශෝධිත මුදල් පොත (ල.03)

(ii) 2014.08.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය (ල.03)

(මුළු ලකුණු 10)

**06.** (i) විසල්ගේ ව්‍යාපාරයේ 2014.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම තුලනය නොවීය. එහි වෙනස වූ රු.2,400 අවිනිශ්චිත ගිණුමේ හරට සටහන් කරන ලදී. පසුව පහත සඳහන් වැරදි අනාවරණය කර ගන්නා ලදී.

1. රු.800 ක රක්ෂණ ගාස්තු ගෙවීම මුදල් පොතේ නිවැරදිව ලියා ඇතත් රක්ෂණ ගාස්තු ගිණුමේ ලියා නැත.
2. රු.2,000 ක බැංකු ණය ගෙවීම මුදල් පොතේ පමණක් ලියා ඇත.
3. රු.2 00 ක භාණ්ඩ ආපසු එවීම, ණයගැති ගිණුමට හර කර ඇත.

අවශ්‍ය වන්නේ:

(අ) ඉහත දැක්වෙන ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන් (ල.03)

(ආ) අවිනිශ්චිත ගිණුම (ල.02)

(ii) (අ) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල පරමාර්ථ **දෙකක්** සඳහන් කරන්න.

(ල.01)

(ආ) 2014-06-30 දිනෙන් අවසන් වර්ෂය සඳහා "වැලෙන්ජ්" ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| සාමාජික මුදල් | 47,000 | බිලියඩ් කාමර වියදම් | 10,000 |
| බිලියඩ් කාමර ලැබීම් | 24,000 | ප්‍රදර්ශන තරඟ වියදම් | 5,000 |
| ප්‍රදර්ශන තරඟ ලැබීම් | 12,000 | විදුලි වියදම් | 1,000 |
| මුදල් පරිත්‍යාග | 1,000 | ක්‍රීඩා පුහුණුකරුවන්ට ගෙවීම් | 1,500 |
| | | ක්‍රීඩාපිටි ගාස්තු | 2,000 |
| | | රක්ෂණ ගාස්තු | 16,000 |
| | | ශේෂය ප/ගෙ | 48,500 |
| | 84,000 | | 84,000 |
| ශේෂය ඉ/ගෙ | 48,500 | | |

- ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් සංඛ්‍යාව 250ක් වූ අතර, වාර්ෂික සාමාජික මුදල් රු.200 කි.

ඉහත තොරතුරු උපයෝගී කරගෙන 2014-06-30 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කරන්න. (ල.04)

(මුළු ලකුණු 10)

**07.** 2014.03.31 දිනට සුජානිගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 500,000 |
| බඩු තොගය2013.4.01දිනට | 10,000 | |
| ගැනුම් | 60,000 | |
| විකුණුම් | | 90,000 |
| ණය ගැතියෝ | 40,000 | |
| ණය හිමියෝ | | 6,000 |
| 10% බැංකු ණය | | 20 ,000 |
| ඉඩම් ගොඩනැගිලි පිරිවැයට | 250,000 | |
| යන්ත්‍ර පිරිවැයට | 150,000 | |
| ආපසු යැවුම් | | 4,000 |
| ආපසු එවුම් | 2,000 | |
| ලැබූ කොමිස් | | 6,000 |
| විදුලිය | 8,000 | |
| රක්ෂණය | 7,000 | |
| විකුණුම් සේවක වේතන | 10,000 | |
| ප්‍රචාරණය | 4,000 | |
| බැංකු ණය පොලී | 1,000 | |
| අතැති මුදල් | 84,000 | |
| | 626,000 | 626,000 |

අමතර තොරතුරු :

(i) 2014.03.31 ඉතිරි තොගය රු.20,000

(ii) යන්ත්‍ර 10% සරල මාර්ග ක්ෂය ක්‍රමයට ක්ෂය කරන්න.

(iii) ණයගැතියන්ගෙන් රු. 2,000ක් බොල් ණය ලෙස කපා හරින්න.

(iv) ඉදිරියට ගෙවූ විදුලිය වියදම රු.2,000කි.

අවශ්‍ය වන්නේ,

(1) 2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභ අලාභ ගිණුම (ල.06)

(2) 2014.03.31 දිනට ශේෂ පත්‍රය (ල.04)

(මුළු ලකුණු 10)

***